**ශීර්ෂය 228 -අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 228 - අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූලි 21 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 6,267.02 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 5,817.05 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 449.97 ක් හෙවත් සියයට 7.18 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 5,061.93 | 4,992.98 | 68.95 | 1.36 |
| මූලධන | 1,205.09 | 824.07 | 381.02 | 31.62 |
| **එකතුව** | **6,267.02** | **5,817.05** | **449.97** | **7.18** |

**2.1** **අත්තිකාරම් ගිණුම**

**2.2.1** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 22801 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 382.16 | 382.16 | 222.22 | 265.85 | 1,200.00 | 893.99 |

**2.2** **අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/000/00328/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 288.2 ක් විය.

**2.3** **පොදු තැන්පත් ගිණුම**

**දෙපාර්තමේන්තුව යටතේ අංක** 6000/0000/00/0015/0109/000 දරන පොදු තැන්පත් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. මිලියන 8,046.24 ක් විය.

**2.4** **විගණන නිරීක්ෂණය**

අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

3. **ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1** **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරික්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| (ii) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |
| (iii) | දඩ මුදල් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 586(1) | ගම්පහ මහාධිකරණයේ පවත්වා නොතිබුණි. |
| (iv) | හිඟ දඩ මුදල් ලේඛනය | මුදල් රෙගුලාසි 586(2) | ගම්පහ මහාධිකරණයේ පවත්වා නොතිබුණි. - |
| (v) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |

**3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 22801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) 2015 දෙසැම්බර් 31 දිනට පාලන ගිණුමේ සහ කේවල ශේෂවල එකතුව අතර රු.12,254,467 ක වෙනසක් පැවතුණි.

(ii) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය අනුව 2015 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.20,779,623 ක්වූ අතර එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 20 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

නීතිපති දෙපාර්තමේන්තුවේ ප්‍රයෝජනය සඳහා මසකට රු.550,000 ක කුලියට පස්මහල් ගොඩනැගිල්ලක් ලබාගෙන තිබුණි. එම ගොඩනැගිල්ලේ මහල් 02 ක්, මාස 06 කට වැඩි කාලයක සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 ජූනි 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එම සියළුම වාර්තා 2016 ජූනි 30 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

## 3.4 අනුකූල නොවීම

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) මුදල් රෙගුලාසි 94(1) | 5,394,853 | සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනයන් කළ පසු ඉතිරිය ඉක්මවා බැඳීම්වලට එළඹ තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 103(ආ) | 291,444 | දෙපාර්තමේන්තුවට අයත් වාහන 06 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පොලිසියට පැමිණිලි කර නොතිබුණි. |
| **(ආ) වෙනත් චක්‍රලේඛ** | | |
| 2011 මැයි 13 දිනැති අංක 333 දරන අධිකරණ සේවා කොමිෂන් සභාවේ චක්‍රලේඛය හා 2011 ජනවාරි 18 දිනැති අංක 01/2011 හා 2014 මැයි 07 දිනැති අංක 01/2011(1) දරන අධිකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛ | - | ගම්පහ මහාධිකරණයේ ඇප තැබිය යුතු නිලධාරීන් 11 දෙනෙකුගෙන් අදාළ ඇප තැන්පතු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 3.5 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම හා ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම පිළිබඳ විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

### (අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළයුතු වූ දිනය | ආරම්භ නොකිරීමට හේතු කෙටියෙන් |
|---|---|---|---|
| ----------- | ---------------- | ---------------- | ----------------------------- |
| | රු. | | |
| (i) මාතර උසාවි සංකීර්ණය ඉදිකිරිම | 1,119,552,000 | 2015 වර්ෂයේදී | ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) බේරුම්කරණ මධ්‍යස්ථානය ඉදිකිරීම | 5,000,000 | 2015 වර්ෂයේදී | මධ්‍යස්ථානයේ ක්‍රියාකාරීත්වයට අවශ්‍ය සමාගම ස්ථාපිත කර නොතිබූ බැවින් උපකරණ මිලදී නොගැනීම. |

**(ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර තිබුණත් එම ව්‍යාපෘති නිම නොකර අතහැර තිබුණි.

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | **2015 දෙසැම්බර් 31 දින වන විට වියදම** | අතහැර දැමීමට හේතු |
|---|---|---|---|---|---|
| | ----------- | --------------- | ------------- | ---------------------- | ----------------------- |
| | | රු. | | රු. | |
| (i) | හඟුරන්කෙත මහේස්ත්‍රාත් අධිකරණ ගොඩනැගිල්ල | 4,372,430 | 1999.12.07 | 874,486 | ඉඩම නිරවුල් නොවීම |
| (ii) | ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණ ගොඩනැගිල්ල | 13,043,563 | 2004/09/04 | 1,138,500 | අමාත්‍යාංශ ලේකම් විසින් කොන්ත්‍රාත්තුව අවලංගු කිරීම |
| (iii) | කණුවන මහේස්ත්‍රාත් අධිකරණ ගොඩනැගිල්ල | 20,129,014 | 2010/08/06 | 4,098,998 | ඉදිරිපත් කර නොතිබුණි. |
| (iv) | මාතලේ නීති ආධාර මධ්‍යස්ථානය හා ප්‍රජා විශෝධන ගොඩනැගිල්ල | 5,394,509 | 2007/12/31 | 938,175 | ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (v) | වෙන්කලඩි උසාවි සංකීර්ණයේ ඉදිකිරීම් | 4,812,500 | අනාවරණය නොවීය. | - | කොන්ත්‍රාත්තුව අවලංගු කිරීම. |
| (vi) | පුත්තලම විනිසුරු බංගලාව ඉදිකිරීම | 12,336,496 | අනාවරණය නොවීය. | - | ඉඩම පිළිබඳ ගැටළුවක් නිසා |
| (vii) | නොච්චියාගම උසාවිය ඉදිකිරීම | 15,030,559 | අනාවරණය නොවීය. | 4,880,000 | ඉදිරිපත් කර නොතිබුණි. |

**3.6 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිවයිනේ ඇති මහාධිකරණ, මහේස්ත්‍රාත් අධිකරණ සහ දිසා අධිකරණ අතරින් 2015 දෙසැම්බර් 31 දිනට මහාධිකරණ 20 ක නඩු 12,917 ක් ද, මහේස්ත්‍රාත් අධිකරණ 39 ක නඩු 158,122 ක් ද, දිසා අධිකරණ 25 ක නඩු 64,522 ක් ද වශයෙන් අධිකරණ 84 ක නඩු 235,561 ක් විසදීමට තිබුණි. ඊට අදාල කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.

| **කාල පරිච්ඡේදය** | **අධිකරණ සංඛ්‍යාව** | **නඩු සංඛ්‍යාව** | **විසදීමට තිබූ මුළු නඩු සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|
| **වර්ෂ** | | | |
| 20 ට වැඩි | 34 | 764 | 0.33 |
| 10 - 20 ත් අතර | 69 | 6,762 | 2.87 |
| 5 - 10 ත් අතර | 80 | 19,335 | 8.21 |
| 3 - 5 අතර | 83 | 40,756 | 17.30 |
| 1 - 3 අතර | 83 | 66,086 | 28.05 |
| 1 ට අඩු | 82 | 101,858 | 43.24 |
| **එකතුව** | | **235,561** | **100.00** |

( ආ ) දිවයිනේ ඇති කම්කරු විනිශ්චය සභා 39 හි 2015 දෙසැම්බර් 31 දිනට නඩු 1,411 ක් විසඳීමට තිබුණි. ඊට අදාල කාල විශ්ලේෂනයක් පහත දැක්වේ.

| කාල පරිච්ඡේදය | කම්කරු විනිශ්චය සභා සංඛ්‍යාව | නඩු සංඛ්‍යාව | විසඳීමට තිබූ මුළු නඩු සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| **වර්ෂ** | | | |
| 15 ට වැඩි | 3 | 5 | 0.35 |
| 10 - 15 අතර | 5 | 5 | 0.35 |
| 5 - 10 අතර | 24 | 57 | 4.04 |
| 3 -5 අතර | 32 | 213 | 15.10 |
| 1 - 3 අතර | 26 | 506 | 35.86 |
| 1 ට අඩු | 13 | 625 | 44.30 |
| **එකතුව** | | **1,411** | **100.00** |

**3.7 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 386 | 400 | - | 14 |
| (ii) | තෘතියික මට්ටම | 85 | 62 | 23 | - |
| (iii) | ද්විතියික මට්ටම | 5,897 | 4,275 | 1,622 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 4,273 | 3,406 | 867 | - |
| | **එකතුව** | **10,641** | **8,143** | **2,512** | **14** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී අධිකරණ පද්ධතියේ පුරප්පාඩු 2,512 ක් පැවතියද 2015 වර්ෂයේ ප්‍රතිපාදන ඉතිරිවීම් කෙරෙහි මෙම පුරප්පාඩු පැවැතීම සැලකිය යුතු බැලපෑමක් වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ අතිරික්ත තනතුරු 14 අනුමත කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.